**35 වන පිටෙන්**




නායකතුමා තම සෘජු මග පෙන්වීම කළේය. නිවෙසේදී තම පියා කෙරෙහි දක්වන සෙනෙහස සහ හැඟීම්බර සමීප බව කාන්තා සාමාජිකාවෝ නායකතුමා වෙත දැක්වූ බව ප්‍රතික්ශේප කළ නොහැකි සත්‍යයයි.

චෝදනා එල්ල කර සංවිධානයේ විනය නීති රීතිවලට අනුව ඔවුන්ට එරෙහිව එම දඬුවම ක්‍රියාත්මක කළේය. වැරැද්දට සම්බන්ධ වූ පිරිමින්ට ද පොදු ජනයා ඉදිරියේ මරණ දඬුවම ක්‍රියාත්මක වීය.

සටන්කාමී සාමාජිකාවන් අතර දැඩි සම්බන්ධතාවක් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා කාන්තා බලඇණි සියල්ල එක්කර කාන්තා සභාව යනුවෙන් සංවිධානයක් ස්ථාපිත කළ යුතුය යන්න කාන්තා සෙන්පතිවරුන්ගේ කැමැත්ත වීය. මෙම අදහස නායකතුමා වෙත ඉදිරිපත් කළ අවස්ථාවේ එම අදහස පිළිගෙන එම රැස්වීමට තමන් සහභාගි වී තම අදහස ප්‍රකාශ කරන බව පැවසුවේය. එම සංවිධානයේ නායකත්වයට කර්නල් විදූෂා ද එයට පහළ නිලයට කර්නල් දුර්ගා ද එහි ලේකම් තනතුරට මා ද භාණ්ඩාගාරික තනතුරට ජ්‍යෙෂ්ඨ සාමාජිකා ජනනී ද තෝරා පත් කර ගත්හ. කාන්තා සභාවේ පරිපාලන වියදම් සඳහා නයකතුමා රුපියල් පනස් දහසක මුදලක් කර්නල් විදූෂා වෙත ලබා දුන්නේය.



කාන්තා හා පුරුෂ සටන්කාමීහු එකට පුහුණුව ලබා එකට කටයුතු කළත්, ඉතාමත් දැඩි විනය නීති රීති උල්ලංඝනය කරන විට දැඩි දඬුවම් ලබා දෙන්නේය. සංවිධානය මෙම කරුණේ දී කාන්තා සටන්කාමීන් උදෙසා ආරක්ෂක පවුරක් වීය. සමහර ව්‍යතිරේඛ සිදුවීම් සිදු නොවුණා නොවෙයි. එහෙත් ඒ සඳහා වන විනය ක්‍රියා මාර්ග සංවිධානය විසින් සිදුකරන ලදි. 1993 වසරේ ජනවාරි මාසයේදී සංවිධානයෙහි සියලුම කාන්තා සාමාජිකාවන් කිලාලිහි සෝදියා කඳවුරේ දී එක්රැස් කර ඔවුන් සියලු දෙනා ඉදිරියේ කාන්තා සාමාජිකාවන් තිදෙනෙකුට මරණ දඬුවම ලබා දෙනු ලැබිණ. වඩමාරච්චි කඳවුරක සිටියදී ඔවුන් තිදෙනා සංවිධානයට අයත් නොවූ පිරිමි සමඟ ලිංගික සම්බන්ධතා පැවැත්වූ බවට

සටන්කාමී කාන්තා සාමාජිකාවන්ගේ කටයුතුවලට අදාළ ව්‍යවස්ථාවක් ද නිර්මාණය කෙරුණි. කාන්තා සටන්කාමීන්ගේ අවශ්‍යතා සහ ප්‍රශ්න ගැන විමසීමක් කර ඒ සඳහා වන වියදම් ද සොය ගත්තේය. මෙම රැස්වීමේ වාර්තාව කෙළින්ම නායකතුමාට යවන හෙයින්, කාන්තා අංශය පරිපාලන ඒකකයන්ගේ අනෙකුත් සෙන්පති තනතුරු දැරූ අය මහත් අවධානයෙන් යුතුව කටයුතු කළහ. සටන් පෙරමුණෙහි ද වෙනත් ක්‍රියාකාරකම්වලදී ද කාන්තා සටන්කාමී නියෝජනය ඉහළින්ම පැවැති හෙයින් කාන්තා සෙන්පති සහ වගකීම් භාර අයගේ අදහස්වලට ඉඩ ප්‍රස්ථාව සලසා දීමට සිදුවීය.

**මතු සම්බන්ධයි**

# ශ්‍රී ලංකාවට භාණ්ඩ යැවීමේදී වංචනිකයන්ට හසුවන්න එපා



ඕස්ට්‍රේලියාවේ වාසය කරන ඔබේ, භාණ්ඩ (unaccompanied baggage ) ශ්‍රී ලංකාවට නිත්‍යානුකූලව යැවීම සදහා පත්කර ඇති නියෝජිතයන් (UPB warehouse or Agent ) පස් දෙනෙක් සිටියි, ඉන් බාහිරව වංචනික ලෙස භාණ්ඩ( unaccompanied baggage) ශ්‍රී ලංකාවට යවන විටදී, රේගුව ඒවා අත්අඩංගුවට ගෙන දැඩි පරික්ෂාවට ලක්කර දඩ මුදල් අයකර ගැනේ. මේ හේතුව නිසා ඔබ යවන භාණ්ඩ නියමිත දිනට නොලැබියයි. මෙය මිටපෙර අවස්ථා කිහිපයකදීම සිදුවී භාණ්ඩ යැවූ ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් මහත් අපහසුතාවට පත් වී ඇත. මේ දිනවලදීත් මෙවැනි වංචනික ක්‍රියාවන්හි යෙදෙන කණ්ඩායම් කිහිපයක් සිටිති.

පළමුව මෙවැනි ව්‍යාජ ලෙස ශ්‍රී ලංකාවට භාණ්ඩ යවන පිරිස කරන්නේ ඕස්ටේලියාවේ වාසය කරන කිහිප දෙනකුගේ (පුද්ගලයින් 3-4) නම් අයථාලෙස භාවිතා කරමින්,ඔවුන්ගේ ගමන් බලපත්‍ර දීමනාවන්ද (passport duty allowance) ව්‍යාජ ලෙස භාවිතා කර ලංකාවට භාණ්ඩ ප්‍රවාහණය කිරීමයි. දෙවනුව මේ මගින් ශ්‍රී ලංකාවට ලැබිය යුතු බදු මුදලක් මගහැරියයි, නිත්‍යානුකූලව භාණ්ඩ ප්‍රවාහණයේදී ශ්‍රී ලංකා රේගුවට නියමිත බදු මුදල් ගෙවීමට සිදුවේ, නමුත් මෙම වංචනික ක්‍රියාවේ යෙදෙන්නන්ගේ අරමුණ ඒ බදු මුදල් ගෙවීම පැහැර හැර එමගින් ලාභ ලැබීමයි .මේ පිළිබදව ශ්‍රී ලංකා රේගුවට තොරතුරු අනාවරණය වීමෙන් පසු ඔවුන් මේ ව්‍යාජ ආයතන සහ ඔවුන් යවන භාණ්ඩ දැඩි පරික්ෂාවට ලකර ඇත, මේ හේතුවෙන් ඔබ ලංකාවට යවන භාණ්ඩ ගැනීමේදී දින ගණන් හෝ සතිගනන් ප්‍රමාදවීම්ද, විශාල දඩ මුදල් ගෙවීම හා අයථාලෙස භාවිතාකරන ඔබගේ ගමන් බලපත්‍රය (passport) නිසා නීතිමය කටුතුවලට පවා මුහුණදීමට සිදුවේ.

ඕස්ට්‍රේලියාවේ ජීවත්වන ඔබ නීතිවිරෝධී ක්‍රියාවලට සම්බන්ද නොවෙති, ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට භාණ්ඩ යැවීමේදී නිත්‍යානුකූල ආයතන පමණක් තෝරාගන්න, තවද එමගින් ඔබ ශ්‍රී ලංකාවේ ආර්ථිකයටද දායකවෙනවා ඇත. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකීය ප්‍රජාවගේ දැනගැනීම පිණිස මේ සටහන තබමු

**වංචනිකයන්ට හසුවූ ශ්‍රී ලාංකිකයන් පිරිසක්**

JAPANESE
By a qualified experienced teacher with proven results
PREP to VCE
- Rapid Learning Strategies
- Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
- Exam Revision and Preparation for VCE written and oral exam.

12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University) , B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.
Contact Number: 0425 396 975

GARDENING AND HANFDYMAN
(Northern Suburbs only)
උතුරු මෙල්බන් ප්‍රදේශයේ පමණකි

Call
0430 246 884